# College of Community Physicians of Sri Lanka

"Wijerama House", No 6, Wijerama Road, Colombo 07
Tel: 0114487139
http:/www.ccpsl.lk

## ශ්‍රී ලංකාවේ ගංජා නීතිගත කිරීමට දරන උත්සහය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජා වෛද්‍ය විශේෂඥවරුන්ගේ සංගමයේ මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජා විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමය යනු ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍ය පිළිබඳව ඇති ඉහළම වෘත්තීය ආයතනයයි. මහජන සෞඛ්‍ය අභියෝගයන්ට ප්‍රතිචාර දැක්වීම හා මහජන සෞඛ්‍යට බලපාන ගැටළු පිළිබඳව තාක්ෂණික උපදෙස් ලබාදීම අපගේ වෘත්තීය වගකීම් වන අතරම අප රට වෙනුවෙන් අපෙන් ඉටුවිය යුතු යුතුකම් ලෙස අප සළකමු.

ගංජා හෝ මර්ජුවානා යනු ඇබ්බැහිකාරකයක් වන අතර එය මහජන සෞඛ්‍යයට අහිතකර ප්‍රතිඵල ලගා කරදේ. ඇබ්බැහිවීම මඟින් පුද්ගලයන්ගේ ඵලදායිතාව සහ යහපැවැත්ම අවම කරන අතර, අන්තර්-මානව සම්බන්ධතාවල ගුණාත්මකභාවය අඩු කිරීම, කුටුම්භ හා සෞඛ්‍ය සේවා පද්ධතිය සඳහා පිරිවැය දැරීමට සිදුවීම, සොරකම්, ප්‍රචණ්ඩ ක්‍රියා වැනි සමාජ විරෝධී ක්‍රියා වැඩිවීම මගින් ප්‍රජාවන්ට හා සමස්ත සමාජයටම අහිතකර බළපෑම් ඇතිවිය හැක. මෑත අතීතයේදී දුම්කොළ සහ ඖෂධ නිෂ්පාදන කර්මාන්තකරුවන්ගේ ගංජා පිළිබඳ උනන්දුව, එය නීතිගත කිරීම සඳහා හොඳින් අරමුදල් සපයන ගෝලීය බලපෑම් ඇතිකරවන ව්‍යාපාරයකට මග පෑදීය. දුම්කොළ ජනප්‍රියත්වයෙන් බැහැර වන හෙයින්, දුම්කොළ කර්මාන්තය විකල්පයක් සොයමින් සිටින අතරම බොහෝ ප්‍රධාන දුම්කොළ සමාගම් දැන් ගංජා වෙළඳාම සඳහා ආයෝජනය කර ඇත. ඔවුනට එය හුදෙක් එක් පත්‍රයක් තවත් එකක් මගින් සැපයුම් හා නිෂ්පාදන ක්‍රියාවලීන්හි ප්‍රතිස්ථාපනය කිරීමකි.

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ගංජා අනෙකුත් මත්ද්‍රව්‍ය වලට යොමු කරවන ප්‍රවේශ මත්ද්‍රව්‍යවයක්  වීමට ඇති හැකියාව පැහැදිලිව ඉස්මතු කරයි. ඒ හරහා තරුණයින් තුළ දුම්කොළ, මත්පැන් හෝ වෙනත් නීති විරෝධී මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමක් ඇතිවිය හැක. අද වෙළඳපොලේ ගංජා වල ඇබ්බැහි කරන රසායනික ද්‍රව්‍යයේ (ටෙට්‍රාහයිඩ්‍රොකැනබිනෝල් - THC) සාන්ද්‍රණය 30%ක් තරම් ඉහළ අගයක් ගන්නා බව අධ්‍යයනවලින් පෙනී යයි. මේ අනුව, වෙළඳපොලේ වර්තමාන ගංජා ප්‍රභේදවලට ඇබ්බැහි වීමට විශාල විභවයක් ඇති අතර එය නීතිගත කිරීම මගින් එහි බහුලතාව සහ ලබාගැනීමේ හැකියාව වැඩි දියුණු කළ හොත් එයින් සිදුවන සෘණාත්මක ප්‍රතිඵලවල වැඩිවීමක් දක්නට ලැබෙනු ඇත. මත්ද්‍රව්‍යයක් නීතිගත කර ඇති පමණින් එහි නීති විරෝධී ස්වරූපය වෙළඳ පොළෙන් අහෝසි වී නොයන බව දුම්කොළ හා මධ්‍යසාර වෙළඳාම් පැහැදිළි උදාහරණ සපයති. ඇබ්බැහි වීම, මනෝ ව්‍යාධිය, මතකයේ ආබාධ, තරුණයින්ගේ මානසිකතත්වයන්ට ස්ථිර ලෙස හානි සිදුවීම, ශ්වසන රෝග, වඳභාවයට පත්වීම සහ හදිසි හෘදයාබාධ ඇතිවීම, හෘද වාහිනීවල රෝග සෑදීම ඇතුළු ගංජා භාවිතයේ සෘණාත්මක ප්‍රතිඵල පිළිබඳ සාක්ෂි රාශියක් තිබේ. කැනඩාවේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ ගංජා නීතිගත කර ඇති ප්‍රාන්ත කිහිපයක මාර්ග අනතුරු වැඩි වීමට ද එය හේතු වී ඇති බව පැහැදිළි විද්‍යාත්මක සාක්ෂි ඇත.

සම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාවේ ගංජා භාවිතය ගැන අපගෙ විරෝධයක් නොමැත. දැනට ඒ සඳහා ශ්‍රී ලංකාව තුල නීතිමය අවසරයද ඇත. එබැවින් රටතුල ගංජා පිළිබඳව  නීතිමය තත්වය වෙනස් කිරීමේ සාධාරණ අවශ්‍යතාවක් අපට නොපෙනේ.  ගංජා නීතිගත කරන්නන් වෙනුවෙන් පෙනී සිටින්නන්, ගංජා භාවිතා කරන්නන්, ගංජා නීතිගත කල යුතුයැයි ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරති. මෙයට අමතරව විවිධ පාර්ශව විසින් ගංජා නීතිගත කිරීම සම්බන්ධයෙන් වැඩි වැඩියෙන් බලපෑම් කරනු අපට මේ දිනවල දැකගත හැක.  නීතිවිරෝධී මත්ද්‍රව්‍යයකට ඇබ්බැහිවූවන්ගේ තර්ක, ප්‍රතිපත්ති සම්පාදකයින් ප්‍රසිද්ධියේ පිළිගැනීම හා වෙළඳපළ තුල ඒවා විකිණීම සාමාන්‍යකරණය කිරීමට දායකවීම පිළිබඳව අපි පුදුම වෙමු.

මෙයට අමතරව, මෙම ව්‍යාපාරයට එරෙහිව හඬ නගන මහජන සෞඛ්‍ය වෙනුවෙන් පෙනී සිටින වෘත්තිකයින්ට සහා අනෙකුත් ක්‍රියාකාරීන්ට බලපෑම් කිරීමේ සංවිධානාත්මක උත්සාහයක්ද පෙනෙන්නට ඇත. මහජන හිතැති නීති සහා ප්‍රතිපත්ති වෙනුවෙන් හඬ නගන වෘත්තිකයන්ට එරෙහි මෙවැනි පුද්ගලික පහරදීම් අප තරයේ හෙළා දකින අතර මෙම සිදුවීම් ගංජා නමැති මත්ද්‍රව්‍යය බහුලවීමෙන් සමාජයට ඇතිවිය හැකි අහිතකර බලපෑම් පිළිබඳ පැහැදිළි සාක්ෂි සපයන බව  විශ්වාස කරමු. ඇබ්බැහිකාරකයක්, මත්ද්‍රව්‍යක් නීතිගත කිරීම සඳහා වන මෙම අහිතකර ව්‍යාපාරයට සහාය නොදැක්වීම මහජනතාවගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීමට වගකීම සහිත රජයක ප්‍රතිපත්තිය වනු ඇතැයි අප අවංකවම බලාපොරොත්තු වෙමු.

වෛද්‍ය නිහාල් අබේසිංහ

2020 සැප්තැම්බර් 23